# ජන ගීයේ රුව ගුණ ආත්ම කොට ගත් 'ගේය කාව්‍ය රචකයා'

පද්‍ය කාව්‍යය, භාවේන්ද්‍රිය හා බුද්ධීන්ද්‍රිය අමතන කලාවක් සේ සැලකේ. ගීතය පළමුව අමතන්නේ ශ්‍රවණේන්ද්‍රියයි. එහෙයින් ගේය කාව්‍ය නොහොත් ගී පද මාලාව ද ප්‍රථමයෙන් ශ්‍රවණේන්ද්‍රිය ඔස්සේ රසික - සහෘදයා වෙත ළං වී, ඉක්බිතිව ඔහුගේ භාවේන්ද්‍රියය ද බුද්ධීන්ද්‍රියය ද අමතන්නේ යැයි සලකනු සුදුසු ය. අපේ ප්‍රාථමික ම ගීතය ලෙස සැලකිය හැකි "ජන ගී" පවා රචනා වී තිබුණේ ඉහත කී අවශ්‍යතාවන්ට අනුකූල වීමෙනි. බොහෝ ජන ගායනා, ශ්‍රවණේන්ද්‍රියය තතු කර ගන්නා ශබ්දාලංකාරවලින් සැරසුණු සුබාවබෝධී භාෂාවකින් රචනා වී තිබීම ම, ඊට කදිම නිදසුනක් සපයයි.

එළිවැට, යමක, අනුප්‍රාස ආදී සරළ ශබ්දාලංකාර මතුනොව, පුනරුක්තිය ද ජනගීයේ අවියෝජනීය අංගයක් ව පැවතිණ. එමතු නොව ජනගී සඳහා වස්තු විෂය වී ඇති මානව ජීවිතයේ භාවික සම්පත් කෝෂ්ඨාගාරය ද භාවේන්ද්‍රිය ඩැහැගන්නට සූදානම් වී සිටියේ ය. හෘදය සංවේදී එකී මානව අත්දැකීම්, ඊට සරිලන භාවික ගුණ සපිරි බසකිනි, ජනගීයට එක්ව තිබුණේ.

සිංහල ජනගීය සහ ජනකවිය සතු මේ මහාර්ඝ සම්පත, නූතන සිංහල ගීතයේ පෝෂණය පිණිස යොදා ගැනුනේ අද ඊයේ නොවේ. පුරෝගාමී ගේය කාව්‍ය රචනයෙහි දී ජනකවිය හා ජනගීය සතු රුවත් ගුණත් සිය රචනයේ ආත්මය කොටගත් නූතන ගේය පද රචකයින් අතර සිසිර දිසානායක මුල් තැන්හි ලා සැලකීම අසාධාරණ නොවෙතැයි සිතේ. එපමණට ම ඔහුගේ ගේය කාව්‍ය

රචනාවන්හි ආත්මය සරසන අත්දැකීම්, භාෂාව හා ආකෘතිය ද රීතිය ද ජන කවියෙන් ජන ගීයෙන් අනුප්‍රාණය ලබන බැවිනි.

ඒ සඳහා ජනශ්‍රැතියට, පුරාණෝක්තියට හා ජන දිවියට පෙම් බැඳගත් සිතක් ද, ඒවා හදාරන ඉවසිලිවන්ත විද්‍යාර්ථියකුගේ තැන්පත් කමක් ද, නිර්මාණාත්මක කල්පනයෙන් හෙබි ප්‍රතිභාවක් ද අවශ්‍යය. සිසිර දිසානායකගේ රචනාවලින් හෙළි වන්නේ ඔහු ඒ සුදුසුකම් බොහොමයක් සපුරා ඇති බව ය.

වැව් බැඳි රාජ්‍යයෙහි පමණක් නොව, ඌව වෙල්ලස්ස පළාතේ ද ප්‍රකට ජන කියමන් අතරේ, "ඉල් - දුරුතු මාසවල වසිනා වැස්ස සමඟ පැමිණෙන සීතල නිසා, කලවැද්දා ගෑනුන් හත්දෙනෙකු ගන්නේ යැයි කියමනක් ඇත. සතා සතුන්ට නොව ඊට වඩා භාවිත ගුණ සපිරි දිවියක් ගෙවන ඒත් මේ සුව ජනයාට ද ඒ හැඟුමින් මිදෙන්නට නොහැකි ය.

හත් දා නව දා බාගෙන වැහැපන්
හත්වෙනි ඉල් මාසේ
හත් දා තනියේ පාළුව නහපන්
හත් වෙනි පොඩි නෑනේ

නිල් කුරහන් හේනේ අද්දර
තොලබෝ මල් පිපිලා
මල්වර හිත් යාය අද්දර
නුඹගෙ රුව පිපිලා,

ආල හිතකට ඇරයුම් කරන මේ පරිසර සංවේදනය ගැමි තරුණයාට ඉහිලුම් නොදේ. පාළුව ඔහුට විඳගත නොහැකි ය. කුරහන් හේනේ අද්දර පිපුණු තොලබෝ මල් මෙන් ඔහුගේ ගැටවර හිතේ ඇගේ රුව පිපී වැනෙයි. ජන හදින් ගත් සංවේදනා, ඊට සරිලන ආගන්තුක නොවන ගේයතා ගුණෙන් පිරි බසකින් ද, රුවකින් ද නිර්මාණාත්මකව ගොඩ නගන්නට මෙහිදී සිසිර සමත් වෙයි.

විස්තීර්ණ පවුලක් ලෙස සමූහනය වී තිබුණු ගැමි සමාජයේ පවුලක සමාජිකයකු බින්න විවාහයෙන් ඈත්ව ගිය පසු දුරස් වී යන සම්බන්ධතා විසින් ඇතිකරනු ලබන වියෝගය පිළිබඳ අත්දැකීම් ඔවුන් වෙතින් ඇතැම් විට ප්‍රකාශයට පත් වන්නේ 'නෝක්කඩුවක' ස්වරූපයෙනි. සිසිර ලියූ 'මැද්දේ ගම් ගිය මද්දුමයා' පිළිබඳ ගීපද එවැන්නකි.

මැද්දේගම් ගිය
මද්දුමයෝ අද
බැද්දේගම් ගැන
නැද්ද වගක් ?

වැඩුමල් සහෝදරයාට පෙනෙන්නේ මද්දුමයාට, මහගෙදර උළුවහු උස මදි වී ගිය බවකි.

යානා නේනා මං වරදින්නා
නුඹැහෙට උළුවහු මදි ද පැලේ ?
අත අහවර දා වත් ඇයි මත් දා
නැවිත් හැරියේ බැද්දේගම් ?'

සිසිර දිසානායකගේ ගේය කාව්‍ය රචනයෙහි තවත් විශේෂතාවක් වන්නේ, ඔහු ජන කවි - ගී ඇසුරු කළ ද, ඒ ඇසුරින් ප්‍රතිනිර්මාණය කරන රචනයේ ආකෘතිය, මූලාශ්‍රයේ ආකෘතියෙන් මිදුණු ස්වායත්ත එකක් වීමයි. ඊට ඔහුට උදව් වන්නේ, ජන පද මාලා ඇසුරින් පූර්ව නිර්මිත තනුවක් අනුව සිය කල්පනා පෙළගස්වන්නට ඔහුට ලැබී ඇති අවසරයයි. එක් අතකින් අභියෝගයක් වී ඇති මේ වෑයම ඔහු හරවත් කර ගන්නට ද සමත් වෙයි. බඹර කපන්නට ගිය දෙමස්සිනාලාගේ නොපැමිණීම වෙනුවෙන් වැලපෙන ගැමි සපත්නියකගේ වැළපුම ගැන ලියද්දී ඔහු ආකෘතිය කොට ගන්නේ, 'බඹරකවි' යේ හැඩරුව නොව, වෙසතුරු වැළපුම් ගීයේ හැඩරුවයි.

සඳසාවී මා
සඳ මඬලේ පාළුවේ මෙදා
බඹර ගලින් රූටාලා
සඳ නිවුණි ද කියපන් මයෙ මලයා ?

දෙමස්සිනාලා - මල් පැණි බීවාදෝ ?
බඹර කපන්ටා
බඹර ගලේ කරණම් ගැසුවා දෝ
අතහැරුනිද යොත වැල මයෙ මලයා ?

ජන ගායනාවන් හි බොහෝ විට දක්නට ලැබෙන සීමිත ස්වර මාලාවක හා ඒකාකාරී තනුවක සිරගත වනු වෙනුවට, ජන නාද මාලා කීපයක ගැටුමෙන් නිර්මිත විචිත්‍ර තනුවක ඇසුර ලැබීම නිසා ඇතැම් විට සිසිරට ඔහුගේ රචනය විසල් පරාසයක චිත්‍රගත කරන්නට අවසර ලැබීම ද ඔහු ලද භාග්‍යයකි. ඔදානිස් රබන්ගුරුගේ 'වැලිතලප', ගජමන් නෝනාගේ ප්‍රබන්ධ, හා කෙළි ගී ඇසුරින් නිර්මිත තනුවකට සිසිර ලියූ 'ගම අවුලඤ්ඤං' නම් ප්‍රකට ගීය ඊට නිදසුනකි. ප්‍රසාංගික ලක්‍ෂණ රැගත් මේ රචනය සිසිර වස්තු කොට ගන්නේ, පැරණි ගැමි සමාජයේ ප්‍රකට චරිතයකි.

සූදුවට පිරුවට ඇඳගෙන        එන්නේ
දානෙට සීලෙට මුලට ම        ඉන්නේ
වයසට යනකොට මොනව ද වෙන්නේ ?
කට වටකර වැට කොහොම බඳින්නේ ?

කේළම් ඕපාදූප
කියමින් ගමවට යාම
සතුටකි නුඹට කදිම
මැගි නැන්දේ

ජන කවියේ සහ ජනගීයේ වාගාලාප හා ගැමිදිවියේ අත්දැකීම් ක්ෂේත්‍රය පමණක් ම සිසිර දිසානායක තම නිර්මාණ සඳහා පාදක කොට ගන්නේ ද නැත. කාලීන සමාජ ජීවිතය, මානව සම්බන්ධතා සහ වාස්තවික ගැටළු ද ඔහු අමතක නොකරයි. 'මිහිකතගේ වියෝව' නම්, ඔහු ලියූ ගීයකට වස්තු විෂය කොට ගන්නේ පරිසර විනාශයයි. ඉන් හට ගන්නා දුර්විපාකයි.

මල් පියලි පාව යාවී
නිල් අහස පාළු වේවී
බිම් බෙදා තැනූ කතරේ
තව් තිසා මැවෙන අතරේ
නිල් කොබෙයි ගී මියේවි
වෙල් ලියැදි ඉරි තැලේවී.

තවත් විටෙක සිසිරගේ ගීයකට නිමිත්ත වන්නේ, නගරයේ සුවිසල් සල්පිලක වීදුරු මැදුරක ඉන්නා සළුපිළි ඇඟලා ගත් 'ඩමි' යුවතියකි.

මේ සල්පිල් යායේ
වීදුරු මන්දිරයේ
ඇසිපිය නොහෙලා බලා හිඳී, ඔබ
දුහැනකි අනන්තයේ

වෙළෙඳ සේවකයා, එනම් කිසිවකුගේ ආදර කරුණාවක් සැලකිල්ලක් නොලබන සුළු සේවකයාගේ වැළපෙන ආධ්‍යාත්මය සිසිර දකින්නේ සානුකම්පිකව ය.

උදයේ සැමදා
දූවිලි පිසදා
අගනා සළුපිළි අන්දවලා
පණ පොවනෙම් ළඳුනේ
නුඹවත් මා ගැන ඇයි නොසිතන්නේ
නිකමටවත් ?

දෙව්ලියන් අමතා, නාරි ළඳුන්ගේ අරුම බලනු පිණිස ඔවුන්ට බිමට වඩින්නැයි කියන සිසිරගේ එක් ගීයක්, තියුණු විවේචක රීතියක් අනුව ලියැවුණකි. දෙව්ලියන්ගේ උවන් පරයන මේ කතුන්ගේ වර්තමානය ළතැවුලින්, පීඩනයෙන් ගහණ වූවකි.

දිව්‍ය විමානේ කැළුම් විහිදන
දිව්‍ය ළඳුන්ගේ උවන පරදන
නාරි ලියන්ගේ අරුම බලන්න
දිව්‍ය ළඳුන්නේ බිමට වඩින්න !

සියොළඟ දියවෙයි කම්හල් යායේ
රූ සිරි විකිණෙයි සල්පිල් ගානේ
සම්මස් බිළිවෙයි රෑ තුන් යාමේ
අතවර බෝමයි යන එන පාරේ

ජනගීයේ හා ජනකවියේ සම්පත් කෙරෙහි ආශක්තව ඒවා සීමා රැස් කරමින් ඉන් නිර්මාණාත්මක 'නව ගීතයක්' නිමවීම වෙනුවෙන්, වෙහෙසෙන සිසිර දිසානායක, අතීත කාව්‍ය ඉක්මවා, වර්තමානයට පා තබන විටත් අත්කර ගන්නා ජයග්‍රහණ රැසකි. ඔහුගේ ගීතයේ ආත්මය ජන සංස්කෘතිය වූව ද, ඔහු එකී පටු පරාසයෙහි ම රඳවා තැබිය යුතු නැත. කාලීන සමාජ අත්දැකීම් නිරූපනය කරනු සඳහා ද ඔහු නිසැකව ම සුදුසු කම් ලබා සිටින්නෙකි.

**රත්න ශ්‍රී විජේසිංහ**
**2005. 07. 03**

## නොදුටු සිහිනයක් !

සිහිනයකින් පවා නොසිතන ඉසව් කරා දෛවය අප රැගෙන යන්නේ කිනම් වූ ආශිර්වාදයකින් ද ? එලෙස මා රැගෙන ගිය එක් ගමන් මගෙක ස්වර්ණමය මං සලකුණකි "සිසිරගේ කුරුටු ගී".

සිසිර දිසානායක නම් වූ සුහුඹුල් ගේය පද රචකයකු දොරට වඩමවනු ලැබුයේ වික්ටර් රත්නායක නම් වූ මහා ගාන්ධර්වයාණන් විසින් යැයි ලොවට මා හඬ ගා කියන්නේ නිහතමානීව තනිව විඳගන්නා සාඩම්බරයකිනි. සිංහල ගීතයේ මහගෙදර වූ ශ්‍රී ලාංකා ගුවන් විදුලි සංස්ථාවේ සරළ ගී වැඩසටහනක් තුළින් ය, ඒ. ඒ මතු නොව එම රචකයාව නිර්මාණය කරන ලද්දේ ද රත්නායකයන්ගේ නිර්මාණ පෙළහරින් පිබිදුණ රසිකත්වය ම යි. මාගේ එක් උපන් දිනයෙක ම'පියාණන් "කළණ මිතුරෝ" සිනමා පටය නැරඹීමට කැඳවා ගෙන ගියේ මා කුඩා සිසුවකු අවධියේ දී ය. එහි වූ රත්නායකයන්ගේ පසුබිම් ගී හඬින් උන්මත්තකයකු වී පිබිදුණා වූ රසිකත්වයයි මාගේ රචනාවන්ට රතු පළස එලූයේ. නිවසේ ආලින්දයේ බොහෝ රාත්‍රී කාලයන්හිදී පැවැත්වුණු ඒක පුද්ගල ගීත ප්‍රසංගය "කන්දොස්කිරියාවක්" ලෙසින් අත්විඳි පවුලේ උදවිය මේ උන්මාදයට අද ද සාක්ෂි දරත්. ගුවන් ගත වන ගී පද රචනා එක්රැස් කරමින්, ඒවා විමර්ශනය කරමින් ගයන්නට උත්සාහ කළ ඒ කුඩා විය අද මා සිහිකරන්නේ මහත් වූ සොම්නසිනි.

මා තුළ පද පෙළ ගැන්වීමේ යම් හැකියාවක් ඇත්නම් ඒ වෙනුවෙන් මා මුලින්ම සිහිපත් කළ යුතුව ඇත්තේ අවිස්සාවේල්ලේ සීතාවක මහා විද්‍යාලයේ සංගීතාචාර්යවරයකුව සිට අප අතරින් මීට වසර තිස් එකකට පෙර වියෝ වූ දිසානායක ආරච්චිලාගේ ගාමිණී ප්‍රේමතිලක නම් වූ මා දයාබර පියාණන් ය. මැදමහනුවර